ධම්මික විජේසිංහ
සුබෝධා ජ්‍යොතිශ සේවය - මෙල්බර්න්

සීසර් සැත්කම් මඟින් දරුවන් බිහිවීම (බිහි කරවීම) දැන් පෙරට වඩා බෙහෙවින් ඉහල ගොස් ය. මුදල් අයකරන පෞද්ගලික රෝහල් වල මේ තත්වය 100% කරම් ඉහළ සම්භාවිතාවක් ගනී.

සාමන්‍ය ප්‍රසූතියකින් දරුවා බිහිවීම අනාරක්ෂිත වූ අවස්ථාවල දී ආරක්ෂාකාරී විකල්පයක් ලෙස "සීසර් සැත්කම" වෛද්‍යවරු නිර්දේශ කිරීම පෙරදී සිදු වුවත්, විලි වේදනාවෙන් හා වෙනත් අපහසුතාවන්ගෙන් මිදීමට මෙකල මව්වරු සිය කැමැත්තෙන් සීසර් සැත්කම තෝරාගන්නා අතර වානිජ ප්‍රයෝජන තකා නිර්දේශ කිරීම්ද බහුලය. මෙහි ඇති වාසිය නම් සුභ වේලාවකට සැත්කම සිදු කොට දරුවා බිහිකරවීමට හැකියාවක් තිබීමයි.






# 'Readymade'කේන්ද්‍රයක් සඳහා සුබ වේලාවකට සිසේරියන් සැත්කමක්

## කුස තුළ ඉන්නා දරුවන්ට කේන්දර හැදීම

ජ්‍යොතිශවේදියෙකු ලවා සුභ වේලාවකට බලවත් කේන්ද්‍රයක් හිමි වන අයුරින් දරුවා බිහි කරවා ගැනීමේ මෙම පුරුද්ද මුලින්ම ශ්‍රී ලංකාවට හඳුන්වා දුන්නේ ජ්‍යොතිශවේදීන් නොව වෛද්‍යවරු හා ඔවුන්ගේ පවුල්වල අය හා හිතවත් අයයි.

ඔවුන්ගෙන් පසු මෙය පුරුදු වූයේ ධනවතුන් හටය. මෙය ආරංචි වීමෙන් අද වන විට පෞද්ගලික රෝහලකට ඇතුලත් විය හැකි මට්ටමේ වැඩි දෙනෙක් ඉහත කී "සෘඨහජාු" කේන්ද්‍රයක් සඳහා වෙලාවන් වෙන් කරවා ගැනීමේ මානසිකත්වයෙන් පෙලෙමින් ජ්‍යොතිශවේදීන් හා වෛද්‍යවරුන් මුණ ගැසෙති.

මේ පිළිබඳව වැඩිපුර යමක් ලිවීමට පෙර මගේ මිත්‍ර ජ්‍යොතිශවේදියෙකුගේ අත්දැකීමක් ඔබ හමුවේ තබමි. ඔහු වසන ප්‍රදේශයේ ධනවත් ව්‍යාපාරිකයෙක් දිනක් හදිසියේ මුණගැසීමට පැමිණියේය, "මල්ලි අපේ නෝනට බබා හම්බෙන්න දින වැටිලා තියෙන්නේ ලබන මාසේ 15 වැනිදාට. ස්කෑන් කරලත් බැලුවා. කෙලි පැටික්කියෙක්. ඩොක්ටර් මගේ යාළුවෙක්. ඒ නිසා අපට සතියකට හමාරකට කලින් සුභ වෙලාවකට බබාව ගන්න පුළුවන් නේද ?. මේක ලොකු උදව්වක් මල්ලී......."

මාගේ මිත්‍රයා මීට පෙර මෙවැන්නක් කර නොතිබුණාත් යට කී තැනැත්තාගේ පෙරැත්තය නිසා දෙමාපියන්ගේ කේන්ද්‍ර දෙකත්, වෛද්‍යවරයාට සැත්කම කල හැකි බව පැවසූ දින පරාසයත්, සටහන් කරගෙන වැඩේ බාර ගන්නා ලදී.

නමුත් අර කී පුද්ගලයා ගෙදර ගොස් කිහිපවරක්ම දුරකථනයෙන් කථා කරමින් දිනයක් හා වේලාවන්ට වාරණයන් පැනවීය.

"ආ මල්ලි මම අර දීපු දිනවලින් සති අන්ත දවස් දෙකේ හවස 2න් පස්සෙ බැහැ ඩොක්ටර් චැනලින් !"

"තව එකක් මල්ලි, සඳුදට සිහිනැති කරන ඩොක්ටර් නිවාඩු. එදාටත් බැරි වෙනවා."

ඒ අනුව ඉතිරි වී ඇත්තේ දින හතරක් පමණි. එකී දිනයන්හි ද යම් යම් කාල වේලාවන් වාරණයට ලක්විණ.

ඒ අනුව මගේ මිතුරා ඉතා සුපරීක්ෂාකාරීව දින කිහිපයක් හා අදාල වේලාවන් තෝරා දෙන ලදී.

"අනේ මල්ලි මේ දින කිහිපයක්ම තියෙන නිසා මේකෙනුත් හොඳම වෙලාව තෝරලා දෙන්නකෝ. අපට ඕනෙ බබාව "ඩොක්ටර් කෙනෙක් කරන්න."

"ඔය වෙලාවල් ටික බොහොම මහන්සියෙන් මම හැදුවේ. කොයි වෙලාවේ ඉපදුනත් කේන්ද්‍රය අයිති දරුවා පින්වන්ත, ආයුෂ වැඩි, නිරෝගී, බුද්ධිමත් කෙනෙක් වෙනවා. දෙමාපියන්ටත් හොඳයි."

"එහෙනම් මල්ලිට ගොඩක් ස්තූතියි. මම මේ වෙලාවන් ටික ඩොක්ටර්ට දෙන්නම්" යි පවසා ව්‍යාපාරිකයා සමුගත්තේය.
මඳ වේලාවකින් මගේ මිතුරාගේ දුරකථනය නද දෙන්නට විය.

"අර දුන්න වෙලාවලින් බ්‍රහස්පතින්දා අයින් කරන්න වෙනවා. එදාට ඩොක්ටර්ට හදිසි වැඩක්. ෂ ඃ ඒ දවස හොඳම දවසද දන්නෑ නේද ?"

"ඒකට කමක් නෑ. ඉතිරි වෙලා තියෙන වෙලාවක් ගන්න." මගේ මිතුරා පැවසුවේය.

දින කිහිපයකට පසු හදිසියේම ව්‍යාපාරික ධනවතා මාගේ මිතුරා හමුවීමට පැමිණියේය.

"අනේ මල්ලි, අර කියපු වෙලාවලට බබාව ගන්න බැරි වුණා. නෝනට අමාරු වෙලා හදිසියේ සීසර් කරන්න වුණා. මම මේ වේලාපත්කඩය හදවා ගන්නයි ආවේ." බලාපොරොත්තු සුන් වූ හඬින් හේ පැවසුවේය.

ඔබේ ශ්‍රී ලාංකික දන්ත වෛද්‍යවරයා
Dr Shahnaaz Ozeer
B.D.S., Dip. Clin. Dent (Restorative) NZ
Dip. Clin. Dent (Oral Medicine) NZ
DENTIST
Facilities are also available for :
Mini implants
Whitening of teeth
Aesthetic dentistry
Preventive Care
1254 Plenty Road, Bundoora 3083
Tel : 03 9467 7760
Sannasa

කොපමණ සුභ වේලාවක් තේරුවද දරුවකු මෙලොව බිහිවීමට තීරණය වූ වේලාවක් ඇත. සාමාන්‍ය දින දීමකින් හෝ, අහඹු ලෙස හෝ, සුභ වේලාවන්ට අනුව හෝ, සීසර් මගින් දරුවා බිහි වන්නේ එය සිදුවිය යුතුව තිබූ, කලින් නියම වී තිබුණු වෙලාවටමය. ප්‍රතිසන්ධි කර්ම ශක්තිය අනුව ආයුෂ, ජීවන තත්වය, බුද්ධිය යනාදියට හිමිකම් ලබන කේන්ද්‍රයක් ලැබෙන පරිද්දෙනි.

දෙමාපිය ජාන ලක්ෂණ, මවගේ පෝෂණය, මුහුණදෙන බාධක, වැනි දෑ තීරණය වන්නේත් එකී ලෙසටමය. කොපමණ සුභ වේලාවක් තේරුවද එම වේලාවට දරුවා බිහි කල හැක්කේ ඒ සඳහා වාසනා බලයක් ඇත්නම් පමණි. මව් කුස තුල මන්ද බුද්ධිකයකු ලෙස ශරීර අවයව, සෛල සැකසී ඇත්නම් කිසි විටෙක බුද්ධිමතෙකුට උරුම වූ ජන්ම වෙලාවකට මෙලොවට බිහිවිය නොහැකි ය. අනික් අතටද එලෙසම ය.




## අඩා තොගේ ගිඩි ගිඩි මෝල හරිකරගන්.

වෑ ඉස්මත්තට වී කල් මරමින් සිටි මා දෙසට කෑ කෝ ගසමින් එන ගැමියන් පිරිස දැක මම ගල්ගැසුණෙමි. මා ඔවුන්ගේ බාසාවෙන්ම ඔවුන් ඇමතුවේ මෙලෙසෙය.

"මොකෑ තොපි ආගිරි ගාන්නෙ..? කාටද බොලව් වල තඩියා ගැහුවෙ..?"

"මේ අහ මහතැන්.. තොගේ ගිඩි ගිඩි මෝල හරිකරගන්.. අනික් හුට්ටප්පරෙත් කෙලෙප්පු කරගෙන විගැහින්.."

"ටිකිරා එකාට නයා ගහලා.. මරු ඉම.. බමරකැලේ වෙදරාළ ළඟට දොක්කන් නොගියොත් ඒකා කම්මුතුයි.."

අසුරු සැණින් ට්‍රැක්ටරය ලෑස්ති කරගන්නා විට ඔවුහු ට්‍රේලරය මත පැදුරක් එලා සිහිසුන් ටිකිරා උන්දෑ ඔසවා ඒ මත තැබූ හ.

"හා යම.." කියමින් කොයින් මාමා ද මා අසළින්ම වාඩි විය.

කොයින් මාමා මගපෙන්වන්නා වීය. වල ගොඩැලි මතින් හැකි තරම් ඉක්මණින් අපි වෙදරාළ ළඟට ටිකිරා උන්දෑ ගෙන ගියෙමු.

පියවර කීපයකට පසු ටිකිරා උන්දෑට සිහිය ලැබුණේ වෙදරාළ ගේ කාරුණික වදන් සමගය.

"අඩා ටිකිරා මලයා... තට මහබෝවේ (ශ්‍රී මහා බෝධිය) පිහිටයි... නැගිට දැන් බී මේ කැඳ උගුර... තට බෙහෙත් වරු තුන කරනකන් මෙහෙ හිට... බොලා කරුවල පාත් වෙන්න කලින් ගමන් ගස්සපියව්... මේ ඉට බොට කඳා හොට බරියා එමට... කැලේ දෙයියන්ට ගතු කියාන පලයව්.. තොපි ගැන බලා කියයි.."

ගැමියන් සමග ආපසු ආ මම මුහුණකට සෝදාගෙන සුපුරුදු පරිදි සැර බීම ටිකක් කොයින් මාමා සමග ගන්නා අතර උන්දෑ මෙසේ දොඩමළු විය

"බඹරකැලේ වෙදරාළ හපනා... ටිකිරා මරු ඉම නතර වුණේ පූරුවෙ පිනකට... අද සිකුරාදා.. හෙට දොහ වුණා නම් උෟ කම්මුතුයි... හෙනහුරාදා..."

"ඒ මොකෑ කොයින් මාමා..?"

"හෙනහුරාදා සරපයා ගැහුවොත් කම්මුතු වෙනවා වැඩියි ...

*සෙනසුරු මහ ගුලිකයාට*
*එක හමාර දළිකි උෟට*
*වම කෑ නම් පැමිණි ඊට*
*දස පැය ගිය නොයන් ඊට*

හෙනහුරාදා දස පැය ගොහින් සරුපයා වම් ඉම කෑවොත් මරු ඉමෙන් ගැළවෙනවා බොරුයි අඩා... බොටත් අද පින්.." එහෙම කියාගෙන මගෙත් හිස අත ගාගෙන උන්දෑ ගෙට ගියේ -...ඕක පතක කුරුටු ගා ගං" කියා ය.

බෝගල